## 2023 පෙබරවාරි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2023.02.08**
**වේලාව - පෙ.ව. 10.30**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | චතුමිණී විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | පී.එල්. වාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, 1991 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපති ධූරය දරා මේ වන විට මිය ගොස් ඇති එල්.වයි.එන්. සෙනවිරත්න මහතාත්, 1991 වර්ෂයේ ගරු ප්‍රාදේශීය සභා සභිකයෙකු ලෙසත්, 1997 වර්ෂයේ

ගරු උප සභාපති ධූරය දරා මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතාත්, ගරු ප්‍රාදේශීය සභා සභික ඩී.ඩී. ඒකනායක මහතා, හේමසිරි පතිනායක මහතා, ඩබ්.එල්.ජී. ජිනදාස මහතා, පී.ජී. පීරිස් අප්පු මහතාටත්,

1997 වර්ෂය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ධූරය දරා මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතාත්, ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්.කේ. පියසේන මහතාත්, එච්.ජී.ජී. ආරියපාල මහතාටත්,

2018 වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ ගරු ප්‍රාදේශීය සභා සභික ධූරය දරා මේ වන විට මිය ගොස් ඇති එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපතිවරුන්ට සහ ගරු ප්‍රාදේශීය සභා සභිකයන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

එසේම අප සභාව 1991 වර්ෂයේ සිට නියෝජනය කරමින් මේ වන විට මියගොස් ඇති මහජන නියෝජිතයින් පිළිබද තොරතුරු ගරු උප සභාපති සුදත් විදානගමගේ මහතාගෙන් සහ 1997 වර්ෂයේ සිටි මහජන නියෝජිතයින් පිළිබද තොරතුරු ගරු සභික, වාලි ගුණරත්න මහතා යන ජ්‍යෙෂ්ඨ සභිකයින්ගෙන් ලබා ගැනීමට කටයුතු කළ බව මේ අවස්ථාවේ සිහිපත් කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2023 වර්ෂයේ පෙබරවාරි මස පැවැත්වෙන මාසික මහා සභාව සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය ඇතුළු නිලධාරී මහත්මිය පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2023.01.09 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2023.01.09 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2023.01.09 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා සහ ආර්. රජිත ප්‍රියදර්ශන මහතා එවා ඇති නිවාඩු ලිපිය නිවේදනය කරන ලදී.

ඒ අනුව, ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා සහ ආර්. රජිත ප්‍රියදර්ශන මහතා විසින් එවා ඇති නිවාඩු ලිපි පරිදි එතුමන්ලාගේ නිවාඩු මහා සභාව විසින් අනුමත කරන ලදී.

II. තිස්සමහාරාම බල ප්‍රදේශයේ සිදු කරනු ලබන ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම, ගොඩනැගිලි සංවර්ධන අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා 2023 වර්ෂයේ ජනවාරි මස දක්වා සැලසුම් කමිටුවට යොමු කරන ලද සැලසුම්පත් ලේඛන ගරු මහා සභාවට ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

**2023 ජනවාරි මාසය- සැලසුම් කමිටු වාර්තාව**

| අනු අංක | ලි.ප.අ. | නම | අනුමත වීම/නොවීම | කමිටු දිනය |
|---|---|---|---|---|
| 1 | අ/බෙ/2022/102 | කේ.එම්.කුසුමාවතී | අනුමත නොවිය | 2023.01.19 |
| 2 | අ/බෙ/2023/04 | වී.පී.සජිත් තිලක්ෂණ | අනුමත විය | 2023.01.19 |
| 3 | අ/බෙ/2023/05 | ජේ.ඩී.ජයන්ත | අනුමත විය | 2023.01.19 |

| | | | | |
|---|---|---|---|---|
| 4 | අ/බෙ/2023/06 | එම්.ජී.දයානන්ද | අනුමත විය | 2023.01.19 |
| 5 | අ/බෙ/2023/01 | එම්.ඒ.ඉන්දික | අනුමත විය | 2023.01.19 |
| 6 | අ/බෙ/2023/03 | එස්.පී.සුසන්ත සුජීව | අනුමත විය | 2023.01.19 |
| 7 | අ/බෙ/2023/02 | එච්.එල්.ප්‍රේමරත්න | අනුමත විය | 2023.01.19 |
| 8 | සං/අ/2022/76 | එම්.එල්.කේ.සරත්චන්ද්‍ර | අනුමත විය | 2023.01.19 |
| 9 | සං/අ/2023/04 | එස්.කේ.දිලානි මධුෂා | අනුමත නොවිය | 2023.01.19 |
| 10 | සං/අ/2022/97 | එච්.පී.බී.එම්.කුමාර | අනු.ස.අනුමත විය | 2023.01.19 |
| 11 | සං/අ/2023/02 | එච්.එල්.නිමේෂ් මධුෂංක | අනුමත විය | 2023.01.19 |
| 12 | සං/අ/2022/84 | තිළිණ කුලකුලසූරිය | අනුමත විය | 2023.01.20 |
| 13 | සං/අ/2022/01 | එස්.පී.සුසන්ත සුජීව | අනුමත විය | 2023.01.19 |
| 14 | සං/අ/2019/73 | සුමින්ද නිරෝෂ් විජේසිංහ | අනු.ස.අනුමත විය | 2023.01.19 |
| 15 | සං/අ/2023/03 | එස්.පී.සුසන්ත සුජීව | අනුමත විය | 2023.01.19 |
| 16 | සං/අ/2018/11 | එච්.ඩබ්.එන්.පී.ශෂිමාල් | අනු.ස.අනුමත විය | 2023.01.19 |
| 17 | සං/අ/2021/77 | එච්.ඒ.ඩී.මයුරංගනී | අනු.ස.අනුමත විය | 2023.01.31 |
| 18 | සං/අ/2023/05 | ඩබ්.ජී.නිලන්ත ප්‍රියදර්ශන | අනුමත විය | 2023.01.31 |
| 19 | සං/අ/2023/06 | එම්.ඒ.ඉන්දික | අනුමත විය | 2023.01.31 |
| 20 | සං/අ/2023/07 | එම්.ඒ.ඉන්දික | අනුමත විය | 2023.01.31 |
| 21 | සං/අ/2023/09 | එම්.එෆ්.සිසිර කුමාර | අනුමත විය | 2023.01.31 |
| 22 | සං/අ/2023/10 | එම්.එෆ්.සිසිර කුමාර | අනුමත විය | 2023.01.31 |
| 23 | සං/අ/2023/11 | එම්.එෆ්.සිසිර කුමාර | අනුමත විය | 2023.01.31 |
| 24 | සං/අ/2022/82 | එච්.කේ.ඒ.කසුන් උදාර | අනුමත විය | 2023.01.31 |
| 25 | සං/අ/2023/08 | එස්.පී.වීරවර්ණ | අනුමත විය | 2023.01.31 |
| 26 | අ/බෙ/2023/08 | එස්.ඒ.සරත් | අනුමත විය | 2023.01.31 |

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 223/54 හා 2021 ජුලි මස 08 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව, සංවර්ධන අවසර පත්‍රයේ වසර 03 ක කාලය අවසන් වූ පසු සංවර්ධන බලපත්‍රය අලුත් කිරීමක් සිදු නොකර, ගොඩනැගිල්ල භාවිතයට ගැනීම සිදු කළහොත් හෝ අනුකූලතා සහතිකය ඉලුල්ම් කරන විට සංවර්ධන බලපත්‍රයේ වසර 03 ක කාලය අවසන් වූ දින සිට අනුකූලතා සහතිකය ලබා ගන්නා දින තෙක් දවසකට රු. 100.00 බැගින් වූ දඩ මුදලක් අය කර ගැනීම සිදු කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් මා සැලසුම් කමිටුව සමඟ සාකච්ඡා කර, 2018 වර්ෂයේ සිට රටේ පැවැති කොරෝනා වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුධකාරී තත්ත්වය පිළිබද සලකා බලා නාගරික සංවර්ධන අධිකාරියෙන් සහනයක් සලසන ලෙසට මා විසින් සැලසුම් කමිටුවට යෝජනාවක් ද සිදු කරන ලදී. තවද මේ සම්බන්ධයෙන් ජනතාවට සහනයක් ලබා දෙන ලෙසට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යැවීමටත් තීරණය කරන ලදී.

තිස්සමහාරාම බල ප්‍රදේශයේ ජනතාවට මතු වන මෙවැනි ගැටළු විසදාලීම සඳහා මැදිහත් වී, ඔවුන් සඳහා සහනයක් ලබා දීමට අප සියලුම දෙනා එක්ව කටයුතු කළහොත්, එහි ගෞරවය අප සියලුම දෙනාට හිමි වනු ඇත. මහජන නියෝජිතයින් ලෙස අප පෙනී සිටින්නේ ජනතාව වෙනුවෙන් කටයුතු කර, ඔවුන් හට සේවයක් කිරීම උදෙසාම බව ප්‍රකාශ කර සිටින ලදී.

සභාවේ 2023 වර්ෂයේ ආදායම රුපියල් කෝටි 22 දක්වා වැඩි කර ගැනීමට වැඩපිළිවෙලවල් සකස් කර ඇති බවත්, එකී ඉලක්කගත ආදායම සපුරා ගැනීමෙන් තිස්සමහාරාම ජනතාවට වැඩි සේවාවන් රැසක් ඉටු කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

III. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ හිටපු සභාපතිවරයෙක් ඇතුළු කණ්ඩායමක් පසුගිය දිනක සභාවට පැමිණි ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ අත් අත්‍රිකා බෙදා දීමක් සිදු කර ඇත. මැතිවරණ කටයුතු ආරම්භ කර නොමැති අවස්ථාවක, රජයේ ආයතනයකට පැමිණ නිලධාරීන් අපහසුතාවයට පත් වන අයුරින් අත් පත්‍රිකා බෙදා හැරීමේ කටයුතු සිදු කිරීම නීතිය උල්ලංඝනය වන කරුණකි. එම නිසා මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවට දැන්වුවහොත් නීතිමය කටයුතු සිදු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් මහා සභාවට දන්වා සිටින ලදී.

මැතිවරණ කටයුතු ආරම්භ කර නොමැති අවස්ථාවක මැතිවරණ ප්‍රචාරණ සේවා, අත් පත්‍රිකා බෙදා දීම්, දැනුවත් කිරීම් කටයුතු සිදු කිරීම නීතිමය අයුරින් මෙම කාලයේ සිදු කළ නොහැකි බවත් වැඩි දුරටත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

- **ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා**

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ සේවක මහත්ම මහත්මීන් සඳහා දෙසැම්බර් මාසයේ දිවා ආහාරය ලබා දීම වෙනුවෙන් බිල්පත් අංක 008, 009 යටතේ රු. 86,560.00 ක මුදල සිසිල රෙස්ටුරන්ට් ආයතනය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් මහසෙන්පුර ආදාහනාගාරයේ ආදාහන සිදු කිරීම වෙනුවෙන් 2023 ජනවාරි මස අවශ්‍යතාවය මත ගෑස් මිලදී ගත් අදාළ බිල්පත් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පූජා භූමි මල් කඩ හා කිරින්ද පොදු වෙළඳපොළ යන ස්ථානවල පිහිටි කඩ කාමර 110 ක 2020 ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවල හිඟ කඩ කුලී හා ප්‍රමාද ගාස්තු රු. 318,690.00 ක මුදල කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය පරිදි, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය හා 1987 අංක 12 දරණ පළාත් සභා පනතේ (අනුශාංගික විධිවිධාන පනතේ) 2(1) අ වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022.12.30 ලබා දුන් අනුමැතිය පරිදි, රු. 318,690.00 ක මුදල ලේඛනවලින් කපා හැරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. තිස්සමහාරාම පූජා භූමි රථවාහන නැවතුම්පොළ පළමු හා දෙවන පියවර කඩ කාමර සඳහා අය කරනු ලබන ප්‍රමාද ගාස්තු රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බැවින්, එම මුදලින් කඩ හිමියන් නිදහස් කොට කඩ හිමියන් වෙත සහන ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි. (2023 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස සඳහා)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩකාමර හා පන්නගමුව ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර ටෙන්ඩර් කිරීමේදි ටෙන්ඩර් ලංසු ඉදිරිපත් කර, ලංසු තේරිපත් නොවූ අයදුම්කරුවන් සඳහා ඔවුන් තැන්පත් කරන ලද රු. 25,000.00 ක ඇප තැන්පත් සුරකුම් මුදල නැවත එම අයදුම්කරුවන් සඳහා ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

| අනු අංකය | විස්තරය | බිල් අංකය | මිළට ගත් ආයතනය | මුදල රු.00 |
|---|---|---|---|---|
| 01. | සභා කාර්යාලයේ ගබඩාවට ලිපිද්‍රව්‍ය මිළට ගැනීම - 2023 වර්ෂය | 2063<br>2064 | කළුආරච්චි බුක් ෂොප් | 290,460.00 |
| 02 | කාවන්තිස්සපුර පෙර පාසලට සිමෙන්ති 50 kg බෑග් 24 මිළට ගැනීම | 1122 | යෂිඳු ප්ලාස්ටික් බැරල් ඇන්ඩ් මේට්ල් | 61,200.00 |
| 03 | සභා කාර්යාලයට දෛනික ලැබීම් සටහන් පොත් 60 ක් මිලදී ගැනීම | _ | රත්න ග්‍රැපික් ඇන්ඩ් ප්‍රින්ටර්ස් | 48,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. විථී පහන් මිලදී ගැනීමේ දී රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

| අනු අංකය | විස්තරය | බිල් අංකය | මිළට ගත් ආයතනය | මුදල රු.00 |
|---|---|---|---|---|
| 01. | LED Cobra Street Lamp Chip | INV-87781451 | සුපර් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් මාර්කටින් | 39,750.00 |
| | Flash Driver | | | 67500.00 |
| | එකතුව | | | 107250.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. පහත සඳහන් කර්මාන්ත සඳහා සකස් කළ ඇස්තමේන්තු අනුව, එකී කර්මාන්ත සෘජු ශ්‍රමික පදනම මත සිදු කිරීමේ දී සභාව සතුව කම්කරුවන් අවම වීම හේතුවෙන්, පුහුණු/ නුපුහුණු ශ්‍රමිකයින් පිටතින් ලබා ගෙන සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කර්මාන්තයේ නම | ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|
| 01 | දෙබරවැව සුසාන භූමියේ වම්පස තාප්පය ඉදිකිරීම | 2109112.20 |
| 02 | ඇඳුම් මාරු කරන කුටි ඉදිකිරීම (එක් කුටියක් සඳහා) | 211227.50 |
| 03 | විජිතපුර ග්‍රාම නිළධාරි වසමේ මුතියම්මාගම මෝල මාවත මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 252540.55 |
| 04 | විජිතපුර ග්‍රාම නිළධාරි වසමේ මුතියම්මාගම පාසල් මාවත 01 පාර මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 299809.90 |
| 05 | විජිතපුර ග්‍රාම නිළධාරි වසමේ එකමුතුගම ජල ටැංකි මාව මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 193173.84 |
| 06 | ඇල්ලගල වම් ඉවුර පද්මිණී මහත්මියගේ නිවස පාර මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 193173.84 |
| 07 | ටිකිරි උදානපුර අතුරු මාර්ගය (1,2,3,4) මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 557891.30 |
| 08 | මහසෙන්පුර පාසල අසල මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 228905.88 |
| 09 | මහසෙන්පුර රුක්මන් රත්නායක මහතාගේ නිවස අසල මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 228905.88 |
| 10 | වීරහෙල පුබුදුගම ඇල මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 564911.88 |
| 11 | පුල්පල්ලම මහසොහොන්ගම ප්‍රධාන මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 564911.88 |
| 12 | කෝන්වැලැන ග්‍රාම නිළධාරි වසමේ ජයසූරිය බස්නාව අසල මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 564911.88 |
| 13 | අන්දරගස්යාය විහාරස්ථානය අසල මාර්ගය පාර මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 564911.88 |
| 14 | රබර්වත්ත පාදිලිගම පාර මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම | 804891.00 |
| 15 | කාවන්තිස්සපුර පෙර පාසල් ගොඩනැගිල්ලේ දැල් ආවරණ සහ යකඩ දොරවල් සකස් කිරීම. | 647470.10 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා**

ඉහත යෝජනාව මගින් දක්වා ඇති මාර්ග සකස් කළ යුතු තත්ත්වයේ පවතින අත්‍යාවශ්‍යම මාර්ග වේ. මෙම මාර්ග බොහෝ කලක සිට නඩත්තු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ගමන් කිරීමට නොහැකි තත්ත්වයට අබලන් වී ඇත. වැසි සමය ආරම්භ වීමට පෙර මෙම මාර්ග බොරලු යොදා නඩත්තු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

09. පහත සඳහන් කර්මාන්ත සඳහා ගෙවීම් සිදු කිරීමට අනුමැතිය සඳහා මෙම ගරු මහ සභාවට ඉදිරිපත් කරමි.

| අනු අංකය | කර්මාන්තයේ නම | ගෙවීම් සිදු කළ යුතු ආයතනය | බිල්පත් අංකය | වටිනාකම |
|---|---|---|---|---|
| 01 | පන්නගමුව ගොවි සෙවණ වටා විදුලි කණු ස්ථාපිත කිරීම | යසිදු ප්ලාස්ටික් ඇන්ඩ් මෙටල්ස් | 1104 | 43750.00 |
| 02 | කාවන්තිස්සපුර පෙර පාසල ඉදිකිරීම (දෙවන අදියර) - ගල් කුඩු මිලදී ගැනීම | ඉදුනිල් කොන්ක්‍රිට් වර්ක්ස් | 270 | 34500.00 |
| 03. | අංජලිගල ගල්රෑන මාවත නඩත්තු කිරීම සඳහා හියුම් පයිප්ප යෙදීම | සමනල එන්ටර්ප්‍රයිසස් | 802 | 175000.00 |
| 04. | කාවන්තිස්සපුර පෙර පාසල ඉදිකිරීම (දෙවන අදියර) - කොන්ක්‍රිට් මික්සර් සඳහා ගෙවීම | ඉන්දික අයන් වර්ක්ස් ඇන්ඩ් රෙන්ට් සර්විස් | - | 8000.00 |
| 05. | කාවන්තිස්සපුර පෙර පාසල ඉදිකිරීම (දෙවන අදියර) - විල්බැරෝ, ප්ලේට් කුලි පදනම මත ලබා ගැනීම | සුරංග සප්ලයර් | 3579 | 18068.00 |
| 06 | කාවන්තිස්සපුර පෙර පාසල ඉදිකිරීම (දෙවන අදියර) | පුහුණු/නුපුහුණු ශ්‍රමිකයින්ට ගෙවීම | _ | 216000.00 |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

10. පන්නගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය දිවා රාත්‍රී තරඟ පැවැත්විය හැකි පරිදි සංවර්ධනය කිරීමේදී තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බැවින් ක්‍රීඩාංගනයේ වම්පස දැල්වැට ගලවා පවතින ද්‍රව්‍ය සඳහා හිඟ ද්‍රව්‍ය පිටතින් ලබාගෙන සංවර්ධන සිදු කිරීම සුදුසු බව මෙම ගරු මහා සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

11. කාවන්තිස්සපුර තුරු සෙවණ දැන්වීම් පුවරු සකස් කිරීම, යකඩ දොරවල් සකස් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

01.10X 5 (1 nr ) and 4 X 2 (2 nr) size stickers - 01
02.gauge 18 Gi sheet - 16
03. 1X 1 Box Bar 1.2 mm thk - 24
04.1 Gi pipe (1.2 mm thk - 01
05. Anticorrosive paint " enamel paint snd thinner - 01

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

12. කාවන්තිස්සපුර පෙර පාසල් ගොඩනැගිල්ලේ දැල් ආවරණ සකස් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. 12 x 7 size 2 x2 diamond shape welded mesh - 12
2. 11/2 x 11/2 box bar (1.6 mm thick) - 38
3. Anticorrosive paint - 04
4. Enamel paint - 04
5. Thinner - 06
6. No 10 Welding rod - 05
7. Cutting Disk 41/2 size - 05
8. 14 Cutting Plate - 02
9. 2 Paint Brush - 01
10. 12 mm dia Tor Steel - 01

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

13. කාවන්තිස්සපුර පෙර පාසල් ගොඩනැගිල්ලේ යකඩ දොරවල් සකස් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. 32X 32 X5 mm angle iron - 40.0 Ft
02. 3/4 dia Gi pipe - 52.0 ft
03. 3/4 X ¼ Flat iron - 14.0 ft
04. 1/2 X ¼ Flat iron - 63.0 ft
05. 2a1A1 Sheet (0.47 thick ) - 23.0 ft
06. 5.5 mm dia mild steel rod - 18.0 kg
07. 6 කොන්ඩ් පට්ටම් - 3.0nr
08. 2 ඉබි යතුරු - 2 nr
09. 4X3 steel Hinges - 6 nr

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

කාවන්තිස්සපුර පෙර පාසල සඳහා අවශ්‍ය තවත් උපකරණ ලැයිස්තුවක් සකස් කර ඇති බැවින්, එම ලේඛනය සභා ගත කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ සහ ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

මහා සභාව සඳහා කැඳවූ ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් පෙර පාසල සඳහා අවශ්‍ය වන උපකරණ ලේඛනය මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ සහ ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

14. රු. 50000.00 ට වඩා වැඩි වටිනාකමින් යුතුව පහත සඳහන් වාහන අලුත්වැඩියාවන් සිදු කර ඇති බැවින්, ඒ සඳහා ගෙවීම් කිරීමට අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | වාහන අංකය | අලුත්වැඩියාව | ආයතනය | බිල්පත් අංකය-දිනය | මුදල |
|---|---|---|---|---|---|
| 01 | LO - 2933 | ඇම්පියර් 120 බැටරි 2ක් සැපයීම | තිසර ට්‍රේඩර්ස් | 228 – 23.01.18 | 140000.00 |
| 02 | ZA - 5200 | ග්‍රීස් බකට් එකක් සැපයීම | දිනුවන් මෝටර්ස් | 007/22.12.30 | 54000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, ගරු උප සභාපති හා ගරු ප්‍රාදේශීය සභා සභික මහත්ම මහත්මීන්ට 2023 වර්ෂය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය පහත පරිදි ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ද්‍රව්‍යයේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 01 | A4 බන්ඩල් | 01 |
| 02 | හාප්ෂීට් බන්ඩල් | 01 |
| 03 | ෆයිල් කවර | 12 |
| 04 | කාබන් පෑන් | 06 |
| 05 | ස්ටෙප්ලර් පැකට් | 01 |
| 06 | 9x4 ලිපි කවර | 50 |
| 07 | 6x3 ලිපි කවර | 50 |
| 08 | කාබන් කොළ - තනි පිට | 10 |
| 09 | ෆයිල් ටැග්ස් | 24 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සවි කර ඇති 150 w LED Cobra වර්ගයේ වීථි පහන් මේ වන විට අක්‍රිය තත්වයේ පවතින බැවින් එම වීථි පහන් නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා පහත සඳහන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2023.01.02 වන දින බිල්පත් අංක INV - 87781451 යටතේ සුපර් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් මාර්කටින් ආයතනය වෙත රු.107,250.00 ක මුදල ගෙවීම සඳහා මෙම ගරු සභාවට යොජනා කරමි.

- LED COBRA STREET LAMP CHIP - 50
- FLASHE DRIVER - 50

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>LED බල්බ සවි කිරීමේ දී ඒ සඳහා ගම් එකක් අවශ්‍ය වන බැවින්, වීථි පහන් නඩත්තු කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා එකී ගම් එක මිලදී ගැනීමට කටයුතු කරන ලෙසට දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. 2022 වර්ෂය සඳහා තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ ටෙන්ඩර් දේපළ වෙනුවෙන් දෙසැම්බර් මාසය සඳහා බදු සහන ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව, අදායම් පරීක්ෂකගේ වාර්තා හා ඒ සඳහා පත් කරන ලද කමිටුවේ තීරණය පරිදි ගාස්තුවෙන් 75% ක මුදලක් කපා හැරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

18. කඩ කාමර බදු අයිතිය සංශෝධනය කිරීමේ දී අය කර ගනු ලබන මාස 03 ක කඩ කුලී තැන්පතු මුදල් එම බදුකරුවන්ගේ හිඟ කඩ කුලී වෙනුවෙන් හිලව් කර ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2019-02-20 | 006023 | ජී.ඒ. නිරෝෂා ශ්‍යාමලී - තිස්ස පොදු වෙලඳපොල කඩ අංක 72 | 2,400.00 |
| 02 | 2019-02-20 | 006026 | ජී.ඒ. නිරෝෂා ශ්‍යාමලී - තිස්ස පොදු වෙලඳපොල කඩ අංක 72 | 2,400.00 |
| 03 | 2019-07-25 | 008675 | ජී.ඒ. සුජීවා මානෙල් - අංක 63 කඩකාමර | 2,400.00 |
| 04 | 2020-02-12 | 17529 | එම්.එච්. ධනංජය , පැරණි බස් නැවතුම ඉදිරිපිට කඩ අංක 03 | 4,500.00 |
| 05 | 2020-02-12 | 17535 | ලෙස්ලි වීරසූරිය , පැරණි බස් නැවතුම ඉදිරිපිට කඩ අංක 01 | 4,500.00 |
| 06 | 2020-02-12 | 17536 | අයි.ජී. ප්‍රේමලාල් , පැරණි බස් නැවතුම ඉදිරිපිට කඩ අංක 03 | 4,500.00 |
| 07 | 2020-03-10 | 18057 | පී.කේ.ආර්. ප්‍රියදර්ශි , දෙබරවැව දියවර ගොඩනැගිල්ල අංක 07 | 4,050.00 |
| 08 | 2020-06-22 | 19098 | ජී.ඩබ්. සුසන්ත , දෙබරවැව දියවර ගොඩනැගිල්ල අංක 05 | 4,050.00 |
| 09 | 2020-08-13 | 19939 | එල්.කේ. සෙනෙවිරත්න තිස්ස පොදු වෙ.පො. අංක 89 | 3,600.00 |
| 10 | 2020-08-27 | 20389 | යූ.ජී. ලක්මාල්,තිස්ස පරණ බස් නැවතුම ඉදිරිපිට කඩකාමර අංක 16 | 3,750.00 |
| 11 | 2020-11-11 | 21346 | ජී.ඒ. සුනිල් ශාන්ත , තිස්ස නගර සභා කඩ කාමර අංක 07 | 15,000.00 |
| 12 | 2020-11-23 | 21675 | දුමින්ද කුමාර අබේවික්‍රම - තිස්ස පොදු වෙ.පො. අංක 67 කඩය | 2,400.00 |
| 13 | 2020-11-26 | 21685 | කේ.එච්. ලක්ෂ්මී කුමාරි - දෙබරවැව පො.වෙ.පො.අංක 32 | 3,000.00 |
| 14 | 2020-11-27 | 21689 | ජී.කේ. රංජි ප්‍රියදර්ශි , දෙබරවැව දියවර ගොඩනැගිල්ල අංක 06 | 4,050.00 |
| 15 | 2020-11-30 | 21698 | ඩග්ලස් ශාන්ත එදිරිසූරිය ජයවීර , තිස්ස පොදු වෙ.පො.අංක 43 | 3,000.00 |
| 16 | 2020-09-11 | 20582 | ඩබ්.ජී. තුසිත ගාමිණි , තිස්ස බස් නැවතුම අර්ධකාලීන කඩ අංක 12 | 4,200.00 |
| 17 | 2021.01.04 | 22702 | ජේ.ඒ.සමන් සංජීව,දෙබරවැව පොදු වෙළඳ පොළ ,කඩ බක්කි 07 | 1,050.00 |
| 18 | 2021.03.02 | 24266 | ඩී.එම්.බී.සෝමදාස,තිස්ස නව වෙළඳ සංකීර්ණය,කඩ අංක 31 | 9,000.00 |
| 19 | 2021.04.21 | 25504 | අනුරුද්ධිකා ක්‍රිෂාන්ති මනම්පේරි,නව වෙළඳ සංකීර්ණය දෙමහල් , අංක 08 | 12,000.00 |
| 20 | 2021.04.22 | 25515 | එස්.ජී.සුධර්මා ප්‍රියදර්ශනී,තිස්ස පොදු වෙළඳ පොල,අංක 114 | 3,300.00 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | 2021.05.03 | 25534 | සමන්ති කුමාරි මෙට්ටි ආරච්චි,තිස්ස නව වෙළඳ සංකීර්ණය,අංක 33 | 10,500.00 |
| 22 | 2021.07.26 | 26523 | ඩබ්.එල්.ඒ.චමිල ප්‍රියදර්ශන ,තිස්ස පොදු වෙළඳ පොළ | 3,000.00 |
| 23 | 2021.09.21 | 26881 | එල්.චතුරංගිකා,තිස්ස නව වෙළඳ සංකීර්ණය දෙමහල්,අංක 18 | 19,500.00 |
| 24 | 2021.10.05 | 000387 | ඕ.එස්.නදීකා,නව වෙළඳ සංකීර්ණය තනි මහල්,අංක 02 | 10,500.00 |
| 25 | 2021.12.27 | 27982 | බී.එච්.ධර්මසේන , නව වෙළඳ සංකීර්ණය, අංක 13 | 10,500.00 |
| 26 | 2021.08.05 | 092 | ජී.ජී.ඩී.තිලිණ මදුරංග ,තිස්ස බස් නැවතුම්පල ඉදිරිපිට, අංක 02 | 9,900.00 |
| 27 | 2022-01-13 | 28294 | විජේතුංග ලියනපටබැඳිගේ කැලුම් චන්දන | 9,750.00 |
| 28 | 2022-04-08 | 30627 | ඊ.පී.සමන් ප්‍රියන්ත | 3,600.00 |
| 29 | 2022-04-08 | 30624 | ලියනගමගේ කංකානම්ගේ අග්‍රා නිරෝෂණී | 3,600.00 |
| 30 | 2022-04-22 | 30895 | ටී.ජී.කල්පනී සෙව්වන්දි | 1,500.00 |
| 31 | 2022-05-17 | 31253 | එම්.එන්.එච්.සුනිල් ජයන්ත | 4,800.00 |
| 32 | 2022-06-29 | 31889 | කේ.ඩබ්.සුරන්ද | 9,900.00 |
| 33 | 2022-07-12 | 31962 | ඩබ්.එම්.වික්‍රමරත්න | 3,000.00 |
| 34 | 2022-10-14 | 33109 | එච්.ජී.චමරි සුරේඛා | 4,500.00 |
| 35 | 2022-12-06 | 33834 | ඒ.ටී.එන්.ටී.ජයසූරිය | 3,300.00 |
| **එකතුව** | | | | **201,000.00** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජී. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

19. තිස්සමහාරාම බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි කඩ කාමර 48 සහ පන්නෙගමුව නව ආර්ථික මධ්‍යස්ථානයේ පිහිටි කඩ කාමර 28 හි ටෙන්ඩර් පත් විවෘත කිරීම 2023.01.27 වන දින පවත්වන ලද අතර, එහිදී එක් එක් කඩ කාමරය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලංසුපත් අතරින්, වැඩිම ලංසුපත ඉදිරිපත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවන් වෙත එම කඩ කාමරයට අදාළ බදු අයිතිය ලබා දීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය වූ බැවින්, එහිදී වැඩිම ලංසුපත් ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරුවන් වෙත බදු අයිතිය ලබා දීමට සහ ටෙන්ඩර්පත් ඉදිරිපත් නොවූ තිස්සමහාරාම කඩ කාමර අංක 27 සහ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පෝරමයන්හි පැවැති ගැටළු හේතුවෙන් ටෙන්ඩර් අවලංගු කරන ලද අංක 48 කඩ කාමරය මෙන්ම පන්නෙගමුව ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 01 ,02, 03, 04, 06, 07, 08, 09, 10, 11, 12, 13, 14, 16, 17, 18, 19, 20, 22, 23, 24, 25, 26 යන කඩ කාමර නැවත වරක් ටෙන්ඩර් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

20. තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව නමින් ලංකා බැංකුවෙහි පවත්නා සියලුම ඉතිරිකිරීමේ හා ජංගම ගිණුම් අවලංගු කර, මහජන බැංකුව වෙත මාරු කිරීම සුදුසු බවටත්, එම ගිණුම් හි පළමු අත්සන්කරු ලෙස චෙක්පත් අත්සන් කිරීම සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී. රුවිනා දීපානි මහත්මියටත්, දෙවන අත්සන්කරු ලෙස චෙක්පත් අත්සන් කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, කේ.එන්.ජී. ප්‍රමිලා නදීෂිකා මහත්මිය වෙත බලය පැවරීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව නිරන්තරයෙන්ම අපට සහාය ලබා දෙන ආයතනයකි. ප්‍රාදේශීය සභාව රාජ්‍ය ආයතනයක් ලෙස විශාල මුදල් ප්‍රමාණයක් සමඟ ගණුදෙනු කරන ආයතනයක් වන නිසා, අප ආයතනය අවශ්‍ය සියලු පහසුකම් හා සේවාවන් ලබා දීමට කටයුතු කළ හැකි බවට මහජන බැංකුව වෙතින් ලිඛිතවම අප වෙත දන්වා ඇති බැවින්, ඉදිරියේ ආයතනයේ සියලුම ගිණුම් කටයුතු මහජන බැංකුව සමඟ සිදු කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.</u>

<u>මීට පෙර අප ආයතනය ලංකා බැංකුව සමඟ ගනුදෙනු කළද, අප ආයතනයේ පෙර පාසල් 06 ක් පවත්වාගෙන ගියත්, ඉන් එක් පෙර පාසල් දරුවකු සඳහා බැංකුවෙන් ලබා දෙන කුඩා තිළිණයක් හෝ මෙතෙක් ලබා දී නොමැත. නමුත් මහජන බැංකුව සමඟ සාකච්ඡා කළ පසුව, අපට අවශ්‍ය සියලුම සේවාවන් හා පහසුකම් ලබා දෙන බවට ප්‍රකාශ කර ඇති බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

21. තිස්සමහාරාම බහුකාර්ය ගොඩනැගිල්ලේ නව ප්‍රාදේශීය සභා ශාලාවේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා සීඩා ආයතනයේ ලියාපදිංචි හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ කොන්ත්‍රාත්කරුවන් අතුරින් සීමිත මිල ගණන් යටතේ ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. මහසෙන්පුර උප නගරය සංවර්ධනය කිරීම යටතේ රථවාහන නැවතුම්පොළ, භොජුන්හල, නීතිඥ කාමර සංකීර්ණය, වැසිකිළි පද්ධතිය, සන්නිවේදන මධ්‍යස්ථානය, ජල ටැංකිය ඉදිකිරීම යන ව්‍යාපෘති සඳහා සීඩා ආයතනයේ ලියාපදිංචි හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ කොන්ත්‍රාත්කරුවන් අතුරින් සීමිත මිල ගණන් යටතේ ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>උසාවිය අසල ජනතාව නිසි පරිදි පහසුකම් සපයා ගැනීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති නිසා, ජනතාවට අවශ්‍ය සියලු පහසුකම් සපයා ගත හැකි වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන මෙවැනි යෝජනා සම්මත කර දීමත් මා ඇතුළු උප සභාපතිතුමාටත්, ගරු සභිකයින් සියලුම දෙනාටත් එහි ගෞරවය හිමි වනු ඇත.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>**රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

- <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

23. 2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු/ බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා දැනුවත් කිරීමේ ලිපි 2000 කට ආසන්න ප්‍රමාණයක් නිකුත් කිරීමට අවශ්‍ය වේ. එබැවින් ඒ සඳහා අවශ්‍ය මුද්දර මිලදී ගැනීමට අවශ්‍ය නිර්දේශ හා අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

24. අප ආයතනය සතු ZB -0413 අංක දරණ කම්පැක්ටර් රථයේ 2023 වර්ෂයට අදාල වූ රක්ෂණාවරණය ලබාගැනීම වෙනුවෙන් පහත විස්තර සඳහන් බිල්පත ගෙවීම් කටයුතු සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| | වාහන අංකය | විස්තරය | ආයතනය | බිල්පත් අංකය-දිනය | මුදල |
|---|---|---|---|---|---|
| 01 | ZB -0413 | 2023 වර්ෂයට අදාල රක්ෂණාවරණය ලබා ගැනීම | ෆෙයාර් ෆස්ට් ආයතනය - තිස්සමහාරාම | TIMST2300000160000001 | 55583.12 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජී. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

25. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු LL – 7379 අංක දරණ ගලි බවුසරයෙහි ඇති අඩි 55 ක් පමණ වූ බටය දිරාපත් වී ඇති බැවින් ඒ සඳහා විශ්කම්බය අඟල් 04 ක ප්‍රමාණයේ ප්ලෙක්සිබල් ග්‍රීන් හෝස් අඩි 75 ක් මිල දී ගැනීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

26. ආයතනයේ සභා රැස්වීම් ශාලාවේ හා කාර්යාලයේ මුදල් කවුළුව අසල හා ප්‍රජා හා පරිසර අංශයේ සවිකර ඇති වායුසමීකරණ යන්ත්‍ර 03 ක් අක්‍රීය වී ඇති අතර සේවා සැපයීම වෙනුවෙන් ගිවිසුම් ගත වී ඇති සිරිවර්ධන රෙෆ් ඇන්ඩ් එයාර් සර්විස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් ඇස්තමේන්තුව පිළිගෙන, අදාල සේවා සිදු කර බිල්පත් ලද පසු අදාල ගෙවීම් කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

27. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සමහාරාම බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩකාමර හා පන්නගමුව ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධයෙන්, පුවත්පත් දැන්වීම් පල කරන ලද ''දිනමිණ , තිනකරන් හා ඩේලි නිවුස්'' යන පුවත්පත් හි, දැන්වීම් පල කිරීම වෙනුවෙන් රු. 64,368.38 ක මුදලක් ලේක් හවුස් ආයතනය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

28. අප ආයතනය සතු 56-1099 අංක දරණ කැබ් රථයේ වායුසමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් පහත විස්තර සඳහන් බිල්පත ගෙවීම් කටයුතු සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | වාහන අංකය | විස්තරය | ආයතනය | බිල්පත් අංකය-දිනය | මුදල |
|---|---|---|---|---|---|
| 01 | 56-1099 | වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම | තුෂාර ඉලෙක්ට්‍රිකල්ස් - අම්බලන්තොට | 2023.02.07 1625 / 1626 | 70,350.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

29. ජුල්පල්ලම ප්‍රදේශයේ අලුතින් ඉදි කරන ලද නව පෙර පාසල් ගෙවත්ත අලංකරණ කටයුතු සඳහා පහත සඳහන් පැල වර්ග හා මල් බඳුන් අවශ්‍ය බවට පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ දී ද සාකච්ඡා වූ බැවින්, පහත සඳහන් පැල වර්ග හා මල් බඳුන් ජුල්පල්ලම පෙර පාසල් භූමියේ අලංකරණ කටයුතු සඳහා ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- ක්‍රිස්ටිනා පැළ - 50
- ඉවාටා පැළ - 50
- මල් බඳුන් - 50

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>**

30. 2022 දෙසැම්බර් මස මා විසින් ඉදිරිපත් කරන ලද මහජන ආරක්ෂාව සඳහා අධි දීප්ත විදුලි පහන් සවි කිරීම යටතේ ඇති යෝජනාව නව වර්ෂයේ (2023) මෙම සභා වාරය වන තෙක් ක්‍රියාත්මක වී නොමැති බැවින්, එය කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>**

ඉහ. යෝජනාවෙන් දක්වා ඇති ස්ථානවල වංචනික ක්‍රියා, විවිධ අපචාර සිදු වන බැවින්, මහජන ආරක්ෂාව සඳහා මෙකී ස්ථානයන්වල අධි දීප්ත විදුලි පහන් සවි කිරීම අත්‍යාවශ්‍යම කරුණක් වන බැවින්, මෙය ඉටු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

31. අද දින ගරු සභාපතිතුමාගේ අංක 08 යෝජනාවෙහි, අංක 12 හි සඳහන් කෝන්වැලැන ග්‍රාම නිලධාරී වසමේ ජයසූරිය බස්නාව අසල මාර්ගය හා අංක 13 යටතේ සඳහන් අන්දරගස්යාය විහාරස්ථානය අසල මාර්ගය මෝටර් ග්‍රේඩර් කර බොරලු යෙදීම කඩිනමින් ඉටු කර දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>ගරු සභික, ඩබ්.කේ. ටසිත සමිල මහතාගේ ඉහතින් සඳහන් කර ඇති මාර්ගය සකස් කිරීමේ දී ගරු සභික, එන්.ජී. සරත් මහතාගේ කොට්ඨාසයේ අබලන් තත්ත්වයේ පවතින බුබුල පාර ද නඩත්තු කර දීමට තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>

- <u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

32. රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානය නැරඹීමට දිනකට දෙස් විදෙස් සංචාරකයින් විශාල ප්‍රමාණයක් පැමිණෙනු ලබන අතර, ජුල්පල්ලම පාලමේ සිට ටෙලි සිනමා ගම්මානයට ප්‍රවේශ වන මාර්ගයේ විථි පහන් සවි කර ඇති නමුත්, ඒවා ඉතාමත් පරණ අබලන්න තත්ත්වයේ පවතින බැවින්, එම මාර්ගය සඳහා විථි පහන් 10 ක් සවි කිරීමටත්, තුරු සෙවණ සඳහා විදුලිය ලබා ගෙන, එම ස්ථානය සඳහා අධි දීප්ත විථි පහන් සවි කිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2023.02.03 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2023.02.03 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2023.02.03 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2023.02.03 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**(උ) වෙනත් කරුණු**

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහත්මියගේ අදහස් දැක්වීම</u>

මා අන්දරගස්යාය පාසලේ සේවය කරන ලද කාලය තුළ, 2010 වර්ෂයේ මහ මැතිවරණය පැවැත්වෙන කාල සීමාවේ දී එක් දේශපාලන පක්ෂයක් විසින් මා ඉගැන්වීම් කටයුතු කළ විදුහලේ පන්ති කාමරයට පැමිණ අත් පත්‍රිකා කිහිපයක් බෙදීම් කරන අවස්ථාවේ දී එක් අත් පත්‍රිකාවක් පමණක් ගෙන, එපමණක් ඇතියි කියූ වචනයට එම නියෝජිතයින් විසින් මා හට දෝෂාරෝපණ කර, අපහාස වචන වලින් මා හට නොයෙක් අදහස් ප්‍රකාශ කර, මා මෙම පාසලෙන් මාරු කරන බවට ද දන්වා

වැරදි ආකාරයෙන් මා හට බැන වදින ලදී. මා මෙම ප්‍රකාශය අද දින ඉදිරිපත් කරන ලද්දේ 2023 වසරේ පළාත් පාලන මැතිවරණය සඳහා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ නියෝජිතයින් විසින් සභාවට පැමිණ අත් පත්‍රිකා බෙදීමක් සිදු කර ඇති බවත්, ගරු සභාපතිතුමා එය සුදුසු නොවන ක්‍රියාවක් ලෙස පෙන්වා දීමට කටයුතු කළ නිසාවෙන්ය. නමුත්, 2023 වර්ෂයට වඩා 2010 වර්ෂයේ පැමිණි නියෝජිතයින් ඉතාමත් වැරදි ආකාරයෙන් හැසිරී මා අපහසුතාවයට පත් කිරීමට කටයුතු කිරීම ඉතාමත් කණගාටුවෙන් අද දින සිහිපත් කරන ලදී.

මා මාගම විදුහලේ වසර ගණනක් සේවය කර, යෝධකණ්ඩිය විදුහල සඳහා පැමිණි පසුව අත්තනෝමතික ලෙස මා අන්දරගස්යාය පාසලට මාරු කරන ලදී. එම සිදුවීම සිදු වූයේ දේශපාලනික හේතුන් නිසා බවත්, මෙකී සියලු කරුණු සිහිපත් කරන ලද්දේ ගරු සභාපතිතුමා විසින් අද දින දක්වන ලද කරුණු හේතුවෙන් බවත් ප්‍රකාශ කර සිටින ලදී.

- **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>2010 වර්ෂයේ දී ගරු සභික, වැල්ලගේ ජීවානි මහත්මිය ඉගැන්වීම් කටයුතු කළ පාසල් පන්ති කාමරයට පැමිණ එක් දේශපාලන කණ්ඩායමක් විසින් එතුමිය අපහසුතාවයකට පත් වන ආකාරයෙන් කටයුතු කළේ නම්, එය ඉතාමත් වැරදි ක්‍රියාවක් ලෙස අප ද දකී. 2010 වර්ෂයේ එතුමියට සිදු වූ එම අපහසුතාවය පිළිබඳ එදින විදුහල්පතිතුමා වෙත දන්වා මැතිවරණ කාර්යාලයට දැන්වීමට කටයුතු කලේ නම්, එම දේශපාලන නියෝජිතයින් සඳහා එම කාලය තුළම නීතිමය කටයුතු කළ හැකිය. එසේ නොමැතිව 2010 වර්ෂයේ සිදු වූ සිදුවීමක් පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන, අද දින ඒ සම්බන්ධයෙන් පසුතැවීමට කටයුතු කිරීම කිසිදු ඵලයක් නොමැති ක්‍රියාවක් බව දන්වා සිටින ලදී.</u>

<u>රටේ යම් යම් අඩුපාඩුකම් තිබුණද, රට තුළ විශාල වැඩ කොටසක් සිදු කර ඇත. රට System Cahange කළ යුතු නම්, මැතිවරණයෙන් පමණක් නොව, සෑම දෙයකින්ම රට වෙනස් කළ යුතුය. රට එලෙස වෙනස් කර සාර්ථකත්වයට රැගෙන යාමට නම් බෙදීමකට ලක් නොවී, පාට පක්ෂ භේද අත් හැර එකට හිද කටයුතු කළ යුතුය. රට ස්වයං පෝෂිත සංවර්ධිත රටක් කිරීමට නම්, අප සියලුම දෙනා එකට එකතු වී සාමූහිකව කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>අප පාලක පක්ෂය ලෙස කිසිදු සභිකයෙකුට මේ දක්වා වචනයකින් හෝ වැරැද්දක් සිදු කර නොමැත. නමුත් 2022.05.09 වන දින ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් දේශපාලන පලි ගැනීම් මත අප නිවාස කුඩු කර ගිණි බත් කර දැමීම හේතුවෙන්, එක් මහා සභාවකදී අප සිටි දැඩි මානසිකත්වය නිසා ඇති වූ අවේගයට යම් වැරදි වචනයක් ප්‍රකාශ වූයේ නම්, ඒ පිලිබදව අප එදා සේම අදටත් කණගාටු වන බව ප්‍රකාශ කරන ලදී. අප පත්ව සිටි දැඩි මානසික පීඩනය නිසා එදින සිදු වූ එම ආවේගශිලී ක්‍රියාව හැර, කිසිදු සභිකයෙකුට මා අතින් හෝ කිසිදු සභිකයෙකු අතින් වැරැද්දක් වීමට මා ඉඩ ලබා දී නොමැත. සභාපති ලෙස මා සෑම දිනකම පක්ෂ විපක්ෂ සියලුම දෙනාට එක සේ සලකා කටයුතු කර ඇති බව දන්වා සිටින ලදී.</u>

<u>අප සභාවේ සිටින මහජන නියෝජිතයින් සියලුම දෙනා තම ගෞරවය රැකෙන පරිදි අද වන තෙක් කටයුතු කිරීම අප සභාවටම ආඩම්බරයකි. එම ගෞරවයක් රැක ගනිමින් ඉදිරියටත් පාට පක්ෂ භේද නොබලා සියලුම දෙනා එකට එක්ව සාර්ථක ගමනක් යාමට ඉදිරියේ දීත් කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>මැතිවරණ කටයුතු වලදී කුමන දේශපාලන පක්ෂයක් වුවද රාජ්‍ය නිලධාරීන්ට හෝ මහජනතාවට අපහසුතාවයට පත් වන ආකාරයෙන් කටයුතු කරන්නේ නම් එය ඉතාමත් වැරදි ක්‍රියාවකි. එම නිසා 2010 වර්ෂයේ දී ගරු සභික, වැල්ලගේ ජීවානි මහත්මිය පත් වූ අපහසුතාවයට තම කණගාටුව ප්‍රකාශ කරන බව දන්වා සිටින ලදී.</u>

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම</u>**

එක්සත් ජාතික පක්ෂය, මහ ලේකම්, පාලිත් රංගේ බණ්ඩාර මැතිතුමා විසින් 2023.01.30 දින දරණ ලිපිය මගින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන සභිකවරයෙකු වන මා, 2023 පළාත් පාලන මැතිවරණය සඳහා ජාතික ජන බලවේගය පක්ෂය නියෝජනය කරමින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට නාම යෝජනා භාර දී ඇති බවට පැමිණිල්ලක්

ලැබී ඇති බව මා වෙත දන්වා ඇත. මා මේ වන විටත් එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයෙකු ලෙස තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පෙනී සිට කටයුතු කරනු ලබයි. මා වසර 02 ක පමණ කාලයක සිට නැවත දේශපාලනය නොකරන බවට මෙම මහා සභාවේ දීම දන්වා ඇත. එසේ ප්‍රකාශ කළ මා කිසිදු දිනක ජාතික ජන බලවේගය නියෝජනය කරමින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට නාම යෝජනා භාර දී නොමැති බවත්, එම පක්ෂයේ කිසිදු කටයුත්තක් සඳහා සම්බන්ධ වී නොමැති බවත්, මා වෙත ඉදිරිපත් කරන ලද චෝදනාව අසත්‍ය කරුණු වන බවත් අද දින මහා සභාව තුළ සියලුම දෙනාගේ දැන ගැනීම සඳහා ප්‍රකාශ කර සිටින ලදී.

තම කොට්ඨාසය වන යෝධකණ්ඩිය කොට්ඨාසයේ එක් මාර්ගයක් බොරලු යොදා නඩත්තු කර දෙන ලෙසට මීට පෙර ඉල්ලා ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

සියඹලාගස්වැව, රුවන්වැව ආදි වැව්වලින් ගොවි ජනතාවගේ ගොවිතැන් කටයුතු සඳහා ජලය රැගෙන යන ජල පෝෂක මාර්ග ඇහිරී යන ලෙසට පෞද්ගලික අංශ ව්‍යාපාරිකයින් විසින් කුඩා වැව් සකස් කර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් සොයා බැලීම් සිදු කිරීම සඳහා අදාළ ආයතනයන් වෙත දන්වා යවන ලෙසට මීට පෙර සභාවකදී දැන්වූ පසුව, ඒ සම්බන්ධයෙන් අදාළ වගකිව ආයතනයන් වෙත ලිපි යොමු කර ඇති බවත්, එකී ලිපියේ තිස්සමහාරාම පොලිස් ස්ථානයට යොමු කර ඇති ලිපිය තිස්සමහාරාම පොලිස් ස්ථානයට නොව, එම කොට්ඨාසය අයත් වන කිරින්ද පොලිස් ස්ථානය වෙත යොමු කරන ලෙසට දන්වා සිටින ලදී.

ඉදිරියේ දී නැවත මැතිවරණයක් සඳහා ඉදිරිපත් වන සියලුම අපේක්ෂකයින් කිසිදු ගැටුම්කාරී තත්ත්වයක් ඇති කර නොගෙන, එකී කටයුතු සාමකාමීව සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී. ගරු සභාපතිතුමාගේ නිවස ඉදිරිපිටම ජනතා විමුක්ති පෙරමුණ කාර්යාලයක් ඉදි කර තිබීම ඉදිරි ගැටුම්කාරී තත්ත්වයක් ඇති කරවන්නකි. එම නිසා අප සභාව නියෝජන කරන ගරු සභික, වැල්ලගේ ජීවානි මහත්මිය මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, ඉදිරියේ ඇති විය හැකි ගැටුම්කාරී තත්ත්වයන් වළකා ගැනීම සඳහා එතුමියගේ පක්ෂයේ නායකයින් හට මේ සම්බන්ධයෙන් දන්වා, එකී කාර්යාලය එම ස්ථානයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම**

වර්තමානය වන විට මැතිවරණ සේයාවක් ඇත. අද දින අතිගරු ජනාධිපතිතුමා ජාතිය අමතා හොඳ සාරවත් කතාවක් කරන ලදී. එතුමාගේ එම කතාවෙන් සාරවත් අදහස් රාශියක් ප්‍රකාශ කළ බවත්, එහිදී රට තුළ සිදු කළ යුතු System Change එක සම්බන්ධයෙන්ද අදහස් දක්වන ලදී. රට වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා නිවැරදි ක්‍රියාමාර්ග ගෙන කටයුතු කරනු ලබයි. මා වසර 21 ක් එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයෙක් ලෙස දේශපාලනයේ යෙදී සිට තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් සේවාවන් රැසක් ඉටු කර දී ඇත. නමුත් 2023 පළාත් පාලන මැතිවරණය සඳහා අප පක්ෂයේ පක්ෂ මහලේකම්තුමා, පක්ෂයේ නායකතුමා, පක්ෂයේ ආසන සංවිධායකතුමා, පක්ෂයේ කොට්ඨාස සංවිධායකතුමා විසින් මා ඇතුළු අප කණ්ඩායම සඳහා නාම යෝජනා භාර දෙන ලෙසට කිසිදු ආරාධනයක් සිදු කර නොමැති බවත්, ඒ පිළිබඳව අප දැඩි කණගාටුව ප්‍රකාශ කරන බවත් දන්වා සිටින ලදී.

අප එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඉතාමත් කැපවීමෙන් යුතුව කටයුතු කර ඇත. එලෙස අප පක්ෂය වෙනුවෙන් කටයුතු කිරීමේ දී අපගේ ජීවිත සඳහා තර්ජන එල්ල වූ අවස්ථාවන්ද, අප කාර්යාල කඩා බිඳ දමා ඇමු අවස්ථාවන්ද, අප කණ්ඩාය සඳහා පහර දුන් අවස්ථාවන් ද තිබුණි. එලෙස දැඩි අසීරු කාලයන් තුළද අප පක්ෂය වෙනුවෙන් ඇප කැප වී කටයුතු කළ පිරිසකි. එලෙසම පක්ෂ මූලස්ථානයෙන් කුමන කාරණයක් සඳහා දැන් වූ විගසම ඒ සඳහා ද සෑම අවස්ථාවකම අප සම්බන්ධ වී කටයුතු කර ඇත. එම පක්ෂයේ පාක්ෂිකයින් සේ හිද, තිස්සමහාරාම ජනතාව වෙනුවෙන් සේවාවන් රැසක් ඉටු කර දී ඇත. අදත් අප මෙලෙසට බලයට පත් වී කටයුතු කරනු ලබන්නේ එක්සත් ජාතික පක්ෂය නිසාය. අදටත් අප මෙම අවස්ථාවේ දී ද කටයුතු කරන්නේ එක්සත් ජාතික පක්ෂ පක්ෂිකයන් සේ හිදය. මැතිවරණය සඳහා නාම යෝජනා භාර දීමට තිබෙන අවසන් අවස්ථාවේ ද අප පක්ෂය විසින් අප හට නාම යෝජනා භාර දෙන ලෙසට කිසිදු ආරාධනයක් නොලැබුණු තැන, අප දිස්ත්‍රික් නායකතුමා වන අදට සමගි ජන බලවේගයේ නායකතුමන් වන ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා අපව දුරකතනයෙන් අමතා ඉදිරියටත් ජනතා සේවය ඉටු කිරීම සඳහා නැවතත් එතුමන් සමඟ එක් වන

ලෙසට කරන ලද ආරාධනය අනුව, මා ඇතුළු අප කණ්ඩායම සමඟි ජන බලවේගයේ පක්ෂයෙන් මැතිවරණය සඳහා නාම යෝජනා භාර දීමට කටයුතු කරන ලදී.

අප උපන් ගම වෙනුවෙන් නිරන්තරයෙන් ඇප කැප වී කටයුතු කර ඇත. සෑම සභා කාලයකදීම පවතින පාලක පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලබන අයවැය සඳහා පක්ෂව කටයුතු කරන ලද්දේ එම අය වැය මගින් තිස්සමහාරාමයේ ජනතාවට සේවාවක් සිදු වන නිසාය. එලෙස කටයුතු කිරීමේ දී අප පක්ෂය විසින් අප හට විනය පරීක්ෂණ පැවැත්වීමට ද කටයුතු කරන ලදී. නමුත් අප සෑම අවස්ථාවකම තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් පෙනී සිට කටයුතු කර ඇත. එසේ ජනතාව වෙනුවෙන් කටයුතු කළ අප හට එක්සත් ජාතික පක්ෂයේ දොර වැසීමත් සමඟ ඉදිරියටත් ජනතාව වෙනුවෙන් සේවයක් කිරීම සඳහා සමගි ජන බලවේගය පක්ෂය සඳහා එක් වන ලදී.

එක්සත් ජාතික පක්ෂය විසින් මා ඇතුළු අප කණ්ඩායම සඳහා සිදු කරන ලද්දේ දැඩි අසාධාරණයකි. දේශපාලන දිවියේ එක්සත් ජාතික පක්ෂ, පාක්ෂිකයෙකු සිට අද දින අප හට සිදු වූ කණගාටුදායක සිදුවීම පිළිබඳව ගමින් ගමට ගොස් අපගේ පාක්ෂිකයින් සියලුම දෙනා සමඟි ජන බලවේගයට අත්වැල් බැඳ ගැනීමට කටයුතු සලස්වන බව ප්‍රකාශ කර සිටින ලදී.

ගරු සභාපතිතුමාගේ ජනතාවාදී වැඩපිළිවෙල සඳහා සෑම දිනකම මා ඇතුළු අප පක්ෂයේ සහාය ලබා දී ඇත. එලෙස අප සහාය ලබා දී කටයුතු කරන ලද්දේ එලෙස ක්‍රියාත්මක කරනු ලබන සෑම වැඩපිළිවෙලක්ම තිස්සමහාරාම ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා සිදු කරන නිසාය. ගරු සභාපතිතුමාට සේම ඉදිරියේ පත්වන පාලක පක්ෂය සඳහා ද අප සහාය ලබා දෙනු ඇත. එසේම අප සඳහා පාලක බලය ලබා ගැනීමට හැකි වුවහොත් තිස්සමහාරාම ජනතාවට වැඩි සේවාන් රැසක් සිදු කිරීම සඳහා සියලුම දෙනාගේ සහාය බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම</u>

එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මා හටද නාම යෝජනා භාර දෙන ලෙසට පක්ෂයෙන් ආරාධනයක් නොලැබුණි. මේ සම්බන්ධයෙන් පල කර ඇති පුවත්පත් දැන්වීමට අනුව, මා නාම යෝජනා භාර දීමට අදාළ කටයුතු සිදු කරන ලදී. එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයෙක් ලෙස මා ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා සමඟ ද දේශපාලන කටයුතු සිදු කරන ලදී. මාගේ දේශපාලනය අනුව මා නායකයෙක් මත පදනම්ව දේශපාලනය නොකරයි. මා සිදු කරන දේශපාලනය, පක්ෂය පදනම්ව සෑම දිනකම සිදු කරනු ලබයි. මාගේ දේශපාලන පක්ෂය මා හට සෑම දිනකම වටිනා දෙයකි. එම නිසා පක්ෂයට කිසිදු අයෙකු දෝෂාරෝපණ එල්ල නොකරන ලෙසට ඉල්ලා සිටින ලදී.

එකම පක්ෂයක වුවත් දේශපාලන නායකයින්ගේ වෙනස්වීම් මත යම් යම් දේශපාලනික වෙනස්වීම් නිසා, ඒ සම්බන්ධව සත්‍ය ප්‍රකාශ කිරීමෙන් අප සමඟ සිටි ගරු සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මියට ද සභික ධුරයෙන් ඉවත් වීමට සිදු වූ බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම</u>

මැතිවරණයක් සඳහා මුහුණ දී ඇති අවස්ථාවක, පාර්ලිමේන්තුවේ සිටින 225 සිදු කරන ලද ක්‍රියාවන් නිසා පහල මට්ටමේ සිටින දුක් විඳින අප වැනි නියෝජිතයින්ට සිදු වන්නේ අසාධාරණයකි. ඇතැම් දේශපාලන පක්ෂ ගෙයින් ගෙට යාමේ කටයුතු සිදු කරනු ලබයි. නමුත් ඒ සඳහා සම්බන්ධ වී සිටින්නේ පුද්ගලයින් 05-06 ක් වැනි සුළු ප්‍රමාණයකි. ඇතැම් මිනිසුන් බෝක්කු උඩ හිඳිමින් දේශපාලන මත විවිධ ආකාරයෙන් ප්‍රකාශ කරනු ලබයි. කුමන මත ප්‍රකාශ කරමින් දේශපාලනික මතවාද ඉදිරිපත් කළත්, අවසානයේ ජනතාවගේ කැමැත්ත අනුව මැතිවරණයේ ජයග්‍රහණය සිදු වනු ඇත.

ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් මැතිවරණ කටයුතු ආරම්භ කර නොමැති අවස්ථාවක, රාජ්‍ය ආයතනයක් වන ප්‍රාදේශීය සභාවට පැමිණ නිලධාරීන් අපහසුතාවයට පත් වන ආකාරයෙන් මැතිවරණ අත් පත්‍රිකාවන් බෙදා දීමට කටයුතු කලේ නම් එය වැරදි ක්‍රියාවකි. ආයතනයට ඇතුල්වීමට පෙර ඒ සම්බන්ධයෙන් දැනුවත් වීමක් තිබුණේ නම්, එය වළකා ගැනීමට තිබුණු බව ප්‍රකාශ කර සිටින ලදී. ගෙවල් ගිණි තැබීම් සහ කඩා බිඳ දැමීම්වලට කැමති පුද්ගලයින් එකී පක්ෂය සඳහා එක් වේ.

මෙලෙස කටයුතු කරන පක්ෂය සඳහා කිසි දිනක තිස්සමහාරාමයේ බලය ලබා ගැනීමට හැකියාවක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේම නිවස ඉදිරිපිට ජනතා විමුක්ති පෙරමුණ කාර්යාලයෙක් ගසා තිබීම ඉතාමත් වැරදි, ඉදිරියේ ගැටුමක් ඇති විය හැකි ක්‍රියාවකි. මෙලෙස කටයුතු කරනු ලබන්නේ කිසිදු බුද්ධියක්, දැනුමක් නොමැති පුද්ගලයින් බව මෙවැනි ක්‍රියා ලෙස බැලීමේ දී සිතිය හැකිය.

ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ පරිදි තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් සියලුම දෙනා එකට එකතු වී කටයුතු කිරීම සඳහා වේදිකාවක් සකස් කරන්නේ නම්, ඒ සඳහා ස්වාධීන කණ්ඩායමක් ලෙස අපද එකතු වී කටයුතු කිරීම කැමති බව ප්‍රකාශ කර සිටින ලදී.

මැතිවරණ කටයුතු සිදු කිරීමේ දී සාමකාමීව කටයුතු නොකර, ප්‍රචණ්ඩකාරීව සිදු කිරීමට කටයුතු කළහොත්, එම අවස්ථාවේ දී අප සියලුම දෙනා එකට එකතු වී, ඊට අදාළ කටයුතු සඳහා සහාය ලබා දිය යුතුය. සාමකාමී මැතිවරණයක් සිදු කිරීමට මා දැඩි කැමැත්ත පවතින බව ප්‍රකාශ කරන ලදී.

තම කොට්ඨාසයේ පවතින සුදුවැල්ල මාර්ග සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>

මහසෙන්පුර තම කොට්ඨාසයේ අබලන් තත්ත්වයේ පසුවන මාර්ග කිහිපයක් තිබෙන බැවින්, වැසි සමයට පෙර එකී මාර්ග නඩත්තු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

කුමන දේශපාලනික මති මතාන්තර පැවතුණද, සභාව තුළ එකම සහෝදරයින් සේ එකට එකතු වී කටයුතු කරන බවත්, ඉදිරියේ දේශපාලනය සිදු නොකලත්, එලෙස සහෝදරයින් සේ හිඳ කටයුතු කරන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

ජනතා විමුක්ති පෙරමුණ මතය නම් උගත්, බුද්ධිමත්, තරුණ නියෝජිතයින් මැතිවරණය සඳහා එක් කිරීමයි. තම කොට්ඨාසය තුළ දේශපාලන පක්ෂ වශයෙන් එක් එක් අපේක්ෂකයින් නම් කර ඇත. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය උගත්, බුද්ධිමත් නියෝජිතයින් මැතිවරණය සඳහා ඉදිරිපත් කරන්නේ නම්, එයට හොදම ආදර්ශය තම කොට්ඨාසයෙන් බලා ගත හැකි බව දන්වා සිටින ලදී.

අප දේශපාලන පක්ෂය සඳහා පවුල් පාලනයක් යැයි විවිධ විවේචන කළද, පළාත් පාලන මැතිවරණයේ දී ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ එකම පවුල්වල නියෝජිතයින් අපේක්ෂකයින් ලෙස කටයුතු කරනු ඇත. එම පක්ෂයේ දේශපාලන නායකයින් වේදිකාවල කියන අදහස්, ක්‍රියාවෙන් ඉටු නොකරන බව මෙවැනි සිදුවීම් තුළින් වටහා ගත හැකිය. තවද, 75 වසරක සාපය යනුවෙන් විවිධ අදහස් ප්‍රකාශ කළද, එම අදහස් ප්‍රකාශ කරන පක්ෂයේ දේශපාලන නායකයින් එම වසර 75 තුළ නොසිටියේ ද යන්නත් සිතිය යුතු කරුණක් බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>

වැලිපොතේවල සුඩම් මාර්ගය ගමන් කිරීමට නොහැකි ලෙසට අබලන් වී ඇති බැවින්, එම මාර්ගය සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගරු සභික, වැල්ලගේ ජීවානි මහත්මියට 2010 වර්ෂයේ පාසල් ඉගැන්වීම් කටයුතු සිදු කිරීමේ දී දේශපාලන පක්ෂයේ නියෝජිතයින් පිරිසක් අත් පත්‍රිකා බෙදන අවස්ථාවකදී එතුමිය අපහසුතාවයට පත් වන ආකාරයෙන් කටයුතු කළ බව, එම සිදුවීම එම අවස්ථාවේම විදුහල්පතිතුමාට දැන්වූයේ නම්, ඒ සඳහා එම කාලයේ නීතිය ක්‍රියාත්මක කිරීමක් සිදු කිරීමට තිබුණු බව ප්‍රකාශ කර සිටින ලදී.

ඇතැම් දේශපාලන පක්ෂ මැතිවරණ කටයුතු වලදී බොරුව ඇත්ත සේ පෙන්වා, ජනතාව රවටා දැමීමට කටයුතු කරනු ලබයි. දේශපාලනය කරන්නේ නම් එලෙස සිදු නොකර ජනතාවට කිසිදු හානියක් නොවන ආකාරයෙන් සිදු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

වනජීවි දෙපාර්තමේන්තුව විසින් අලුතින් විදුලි වැටක් ගැසීම සඳහා ඊට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගෙන ඇත. මැතිවරණයක් පැවැත්වෙන මෙම කාලයේ අලුතින් විදුලි වැට ගැසීම නවතා දෙන ලෙසත්, මේ සඳහා ගොවි ජනතාව විරෝධතාවය දක්වන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

මැතිවරණ කිරීමේ දී ගැටුම්කාරී තත්ත්වයන් ඇති කර නොගෙන කටයුතු කළ යුතුය. ගරු සභාපතිතුමාගේ නිවස ඉදිරිපිට තිබෙන ජනතා විමුක්ති පෙරමුණ කාර්යාලය ඉදිරියේ ගැටුමක් ඇති වීමට පෙර එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙසට පක්ෂයේ නායකයින් දැනුවත් කරන ලෙසට ගරු සභික, වැල්ලගේ ජීවානි මහත්මියට දන්වා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>අලුතින් විදුලි වැට ගැසීම සඳහා අප කිසිදු අනුමැතියක් ලබා දී නොමැත. තිබෙන විදුලි වැට සක්‍රීය කිරීම සිදු නොකර, අලුතින් විදුලි වැටක් ගැසීමට කටයුතු කළහොත්, ජනතාව වෙනුවෙන් ඒ සඳහා පුථමයෙන්ම අප සභිකයින් 23 දෙනා එම විරෝධයට එක් වී, ඒ සඳහා විරෝධතාවය පල කළ යුතු බව දන්වා සිටින ලදී.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම</u>**

අලුතින් විදුලි වැට ගැසීමක් සිදු නොකර, යෝජිත විදුලි වැට (ගොඩේ කලපුවේ සිට කටගමුව දක්වා) ගැසීම සිදු කළ යුතු බවට මහා සභා වාරයකදී තම අදහස් දක්වා, ඒ පිළිබඳ වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවන ලෙසට ද ඉල්ලීම් කර ඇති බව දන්වා සිටින ලදී.

මීට පෙර කාලයකදී වනජීවී අධ්‍යක්ෂ ජනරාල් මේ සම්බන්ධව නිරීක්ෂණය කිරීමට පැමිණි අවස්ථාවකදී මා සමඟ ගොස් ඒ පිළිබඳව සාකච්ඡා කර, තිබෙන විදුලි වැට සක්‍රිය කරන ලෙසට වනජීවී අධ්‍යක්ෂ ජනරාල්තුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමා සහ ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති ලෙස මාද අත්සන් කරන ලද ගිවිසුමක් ද ලබා දී තිබුණද, වරින් වර වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් තීරණ ලබා ගෙන, අලුතින් විදුලි වැටක් ගැසීමට කටයුතු සිදු කරනු ඇත. එම නිසා යෝජිත විදුලි වැට වන, ගොඩේ කලපුවේ සිට කටගමුව දක්වා යෝජිත විදුලි වැට සක්‍රීය කර, ඉදි කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව දන්වා සිටින ලදී.

ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ දී ගම්වල තාප්ප වැසෙන පරිදි පෝස්ටර් අලවා තාප්ප අපිරිසිදු කර ඇත. මැතිවරණ කටයුතු කිරීමේ දී අප ගම, අපේ නගරය පිරිසිදුව තබා ගැනීමටත්, අලංකාරව තබා ගැනීමටත් සියලුම දෙනා වග බලා ගත යුතුය.

තිස්ස නගරයේ පොලිස් ස්ථානය ඉදිරිපිට භූමියේ ගමන් කිරීමට අපහසු වන ආකාරයේ ලොකු වළවල් හැරී ඇත. මෙම වළවල් ගොඩ කර, ගමන් කිරීමට පහසු වන ආකාරයෙන් එම භූමිය සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

සූරිය ඉඩම පාර, ජනසවි පාර, අයිදෝරිස් ඉඩම පාර යන මාර්ගවල ගමන් කිරීමට නොහැකි ලෙසට අබලන් වී ඇති බැවින්, එකී මාර්ග සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>උද්ධකන්දර ප්‍රදේශයේ විදුලි වැට ගැසීමේ දී අලුතින් විදුලි වැටක් ඉදි නොකර, ගොඩේ කලපුවේ සිට කටගමුව දක්වා යෝජිත විදුලි වැට සක්‍රීය කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු වනජීවී අමාත්‍යතුමිය වෙත ලිපියක් මගින් දන්වා යවන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.</u>

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>**

අද දින මහා සභාව ඉතාමත් නිවැරදි, විධිමත්ව සුහදශීලිව පැවැත්වීමට කටයුතු කිරීම සඳහා සියලුම දෙනා ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී.

ඇල්ලගල ප්‍රදේශයේ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ විමධ්‍යගත ප්‍රතිපාදන මගින් රුපියල් ලක්ෂ 60 ක් වැය කොට, පවුල් 100 ක් සඳහා ගොවිතැන් කිරීමට ගොවිපළ දක්වා ඇලක් සකස් කරන ලද අතර, පසුව එය බත් ඇල දක්වා දීර්ඝ කර දැනට එමගින් ජනතාව යල මහ කන්න 02 සාර්ථකව කුඹුරු ගොවිතැන් කරනු ලබයි. ජනතාවට එවැනි විශාල සේවාවක් සිදු කර තිබියදීත්, එම ප්‍රදේශයේ පාරක් සකස් කර නොමැති බව දන්වා ඇතැම් ජනතාව විවිධ දෝෂාරෝපණ එල්ල කරනු ලබයි. සියලු කටයුතු එකවරම සිදු කළ නොහැක. මාර්ග සකස් කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වුවත්, එම ප්‍රදේශයේ ජනතාවට කුඹුරු ගොවිතැන් කිරීමට

ඇලක් සකස් කර දීමම මහත් සේවාවක් වන නිසා, එලෙස දෝෂාරෝපණ එල්ල කිරීම සුදුසු නොවන බව ප්‍රකාශ කර සිටින ලදී.

මැතිවරණ කාලයක් පැමිණ ඇති අවස්ථාවක, සෑම පක්ෂයක්ම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු නොකර සාමකාමීම සිදු කර ගෙන යාමට සෑම පක්ෂයකම නියෝජිතයින්ට නැණ නුවණ පෑදේවායි ප්‍රාර්ථනා කරන ලදී.

තවද, මීළඟ මහා සභාව 2023 මාර්තු මස 08 වන දින පෙ.ව. 10.00 ට පැවැත්වීමට කටයුතු කරන බව සියලුම දෙනාට දන්වා සිටින ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත් සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 01.30 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2023.02.08 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.